SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර
# வலயக் கல்வி காரியாலயம் கொழும்பு – ஸ்ரீ ஜயவர்தனபுரம்
# Zonal Education Office Colombo - Sri Jayawardhanapura

**දෙවන වාර පරීක්ෂණය - 2025**

**இரண்டாம் தவணைப் பரீட்சை - 2025**

**Second Term Test - 2025**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

**10 ශ්‍රේණිය** | **I පත්‍රය** | **කාලය : පැය 01යි**

**අංක 01 සිට 40 ප්‍රශ්න වලට දී ඇති (1) (2) (3) හා (4) යන පිළිතුරු වලින් නිවැරදි පිළිතුර හෝ වඩා ගැළපෙන පිළිතුර තෝරන්න.**

- **පහත සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සනුලි හා ධනුලි හොඳම මිතුරියන් වන අතර ඔවුන් පිහිනුම් පුහුණුවීම් සඳහා පෙනිංටන් ක්‍රීඩා සමාජයේ පිහිනුම් තටාකයට යති. ඔවුන් එහි සාමාජිකයන් බැවින් බාහිර පුද්ගලයන්ට වඩා සහනදායි මිලක් ඔවුන්ගෙන් අය කරනු ලබයි.

(1). ඉහත සිද්ධියේ සඳහන් අවශ්‍යතාවය වන්නේ,

i. අධ්‍යාපනය ii. ආහාර iii. විනෝදාස්වාදය iv. සෞඛ්‍ය

(2). නිෂ්පාදිතය අනුව මෙම ව්‍යාපාරය,

i. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි. ii. සේවා නිෂ්පාදන ව්‍යාපාරයකි.
iii. හවුල් ව්‍යාපාරයකි. iv. ඒක පුද්ගල ව්‍යාපාරයකි.

(3). පෙනිංටන් ක්‍රීඩා සමාජය අයත් ව්‍යාපාර සංවිධානය වන්නේ,

i. සමිති සංවිධාන ii. සීමාසහිත සමාගම්
iii. හවුල් ව්‍යාපාර iv. කේවල ස්වාමි ව්‍යාපාර

(4). ඉහත සිද්ධියේ සඳහන් පිහිනුම් තටාකය අයත් නිෂ්පාදන සාධකය වන්නේ,

i. භූමිය ii. ශ්‍රමය iii. ප්‍රාග්ධනය iv. ව්‍යවසාය

(5). හිමිකාරීත්වය අනුව ඉහත ව්‍යාපාර සංවිධානය,

i. රාජ්‍ය අංශයේ ව්‍යාපාරයකි. ii. ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි.
iii. පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි. iv. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.

(6). ව්‍යාපාරයක ශක්තීන් හා දුර්වලතා පැන නැගිය හැකි පාර්ශවයක් නොවන්නේ,

i. සේවකයන් ii. කළමනාකරුවන් iii. අයිතිකරුවන් iv. සැපයුම්කරුවන්

(7). පහත I තීරුවේ ඇල්මැති පාර්ශව කිහිපයක් හා II තීරුවේ ඔවුන්ගේ අරමුණු කිහිපයක් සඳහන් වේ.

| I | II |
|---|---|
| 1. සේවකයෝ | A. රැකියා වර්ධනය හා රැකියා තෘප්තිය |
| 2. රජය | B. සාධාරණ මිලට නිෂ්පාදිත ලබා ගැනීම |
| 3. ගනුදෙනුකරුවෝ | C. රැකියා සුරක්ෂිතතාව |
| 4. කළමනාකරුවෝ | D. රැකියා අවස්ථා උත්පාදනය |

ඉහත I හා II තීරු පිළිවෙළින් ගැලපූ විට පිළිතුර වන්නේ,

i. ABCD ii. CDBA iii. CDAB iv. ACDB



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

(8). ආර්ථික පරිසරයට අදාළ කරුණක් නොවන්නේ,

i. රජයේ අයවැය ප්‍රතිපත්තිය
ii. විදේශ විනිමය අනුපාතය
iii. ජාත්‍යන්තර සබඳතා
iv. ආදායම් ව්‍යාප්තිය

(9). ව්‍යාපාරයක දැකිය හැකි තර්ජනයක් වන්නේ,

i. සේවකයන්ගේ උද්ඝෝෂණයක් පැන නැගීම.
ii. යෙද වූ ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීම.
iii. ගංවතුර තත්ත්වයක් ඇතිවීම.
iv. පාරිභෝගිකයන් ව්‍යාපාරය කෙරෙහි ආකර්ෂණය වීම.

(10). නෛතික පරිසරයට අයත් පාර්ශවයක් වන්නේ,

i. අයිතිකරුවෝ
ii. තරගකරුවෝ
iii. කළමනාකරුවෝ
iv. රජය

(11). ඉන්දියාවෙන් නවීන යන්ත්‍රයක් ආනයනය කිරීම ............ට අයත් සාධකයක් වන අතර, ඒ සඳහා එම ආයතනය සමඟ විද්‍යුත් තැපැල මගින් තොරතුරු සන්නිවේදනය කිරීම ............ ට අයත් සාධකයක් වේ. හිස්තැන් වලට ගැළපෙන පිළිතුරු පිළිවෙලින් දැක්වෙන්නේ,

i. ගෝලීය පරිසරය හා තාක්ෂණික පරිසරය
ii. ආර්ථික පරිසරය හා තාක්ෂණික පරිසරය
iii. තාක්ෂණික පරිසරය හා ගෝලීය පරිසරය
iv. තාක්ෂණික පරිසරය හා ආර්ථික පරිසරය

(12). පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

i. අභ්‍යන්තර පරිසර සාධක වෙනස්වීම්වලට භාජනය වේ.
ii. සේවකයෝ බාහිර පරිසර සාධකයකි.
iii. ව්‍යාපාරයක් මෙහෙයවීමට අවශ්‍ය තීරණ ගනු ලබන්නේ කළමනාකරුවන් විසිනි.
iv. ගනුදෙනුකරුවන්ට ව්‍යාපාරය කෙරෙහි බලපෑම් සිදු කළ හැකිය.

(13). නෛතික පුද්ගලභාවයක් ඇති ව්‍යාපාර සංවිධානය වන්නේ,

i. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
ii. ක්‍රිෂාන්ත ස්ටෝර්ස්
iii. සහස් පෙරේරා සහ පුත්‍රයෝ
iv. ශ්‍රී ලංකා වරාය අධිකාරිය

(14). හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම සාමාජික සංඛ්‍යාව 20ක් බවට තීරණය වන්නේ,

i. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතෙනි.
ii. වංචා වැළැක්වීමේ ආඥා පනතෙනි.
iii. 2007 අංක 7 දරන සමාගම් පනතෙනි.
iv. 1918 අංක 6 දරන ව්‍යාපාර නාම ආඥා පනතෙනි.

(15). සංස්ථාපිත සමාගමක වාසියක් නොවන්නේ,

i. වගකීම සීමාසහිත වීම.
ii. ලාභය හා අයිතිය බෙදීයාම.
iii. නෛතික පුද්ගලභාවයක් තිබීම.
iv. අඛණ්ඩ පැවැත්මක් තිබීම.

(16). රාජ්‍ය දෙපාර්තමේන්තු අරමුදල් සම්පාදනය කරගනු ලබන්නේ,

i. රජයේ වාර්ෂික අයවැය ලේඛනය මගින්.
ii. ශ්‍රී ලංකා මහ බැංකුව මගින්
iii. සේවක අරමුදල් මගින්
iv. රජයේ වාණිජ බැංකු මගින්

(17). ගිණුම්කරණයේ අරමුණක් නොවන්නේ,

i. ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීමට තොරතුරු සැපයීම.
ii. ව්‍යාපාරයේ ලාභදායිත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ දැනගැනීම.
iii. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බදු සහන ලබා ගැනීම.
iv. නීතිමය අවශ්‍යතා සැපිරීම.



+

SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

(18). සිද්ධියක් ගනුදෙනුවකින් වෙනස් වන්නේ,
i. ගිණුම්ගත කිරීම සඳහා යොදා ගන්නා නිසාය.
ii. වටිනාකම මුදලින් මැනිය හැකි නිසාය.
iii. වත්කම්, වගකීම් හා හිමිකම්වල වෙනසක් ඇති කරවන නිසාය.
iv. පාර්ශ්වයන් දෙකක් සම්බන්ධ නොවීම නිසාය.

(19). වත්කමක් ලෙස හඳුනාගැනීමට හැකියාවක් නොමැත්තේ,
i. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස බිහිව තිබීම නිසාය.
ii. අනාගත ආර්ථික ප්‍රතිලාභ හිමි නොවීම නිසාය.
iii. එහි නීත්‍යානුකූල අයිතිය ව්‍යාපාරය සතු නොවීම නිසාය.
iv. වටිනාකම මුදලින් මැනිය හැකි වීම නිසාය.

(20). වගකීමක් සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය වනුයේ,
i. එය අනාගතයේදී මුදලින් ගෙවා පියවා දැමීමට සිදු වේ.
ii. අනාගතයේදී ගෙවීමට සිදුවන වර්තමාන බැඳීමකි.
iii. අතීත ගනුදෙනුවක සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බිහිවී ඇත.
iv. ජංගම හා ජංගම නොවන ලෙස කොටස් දෙකකින් යුක්තය.

- පහත තොරතුරු ඇසුරෙන් අංක 21 සිට 23 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  පියසිරි වෙළඳ ව්‍යාපාරය සතු ගිණුම් කිහිපයක් පහත පරිදි වේ.

A - ගොඩනැගිලි
B - ණයහිමියෝ
C - ණයගැතියෝ
D - ගැනිලි
E - බැංකු ණය
F - බඩු තොගය
G - බැංකු අයිරාව
H - ප්‍රාග්ධනය

(21). ජංගම නොවන වගකීමක් වනුයේ,
i. E   ii. B   iii. G   iv. D

(22). ජංගම වත්කම් වනුයේ,
i. A හා F   ii. B හා F   iii. C හා F   iv. D හා F

(23). හිමිකම් ගිණුම් වනුයේ,
i. A හා D   ii. A හා H   iii. D හා G   iv. D හා H

(24). සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
i. ව්‍යාපාරයක හිමිකරුවන් වෙනුවෙන් පවතින වත්කම් ප්‍රමාණය හිමිකම් වේ.
ii. අයිතිකරුවන් යොදවන ප්‍රාග්ධනය නිසා හිමිකමේ සිදුවන වැඩිවීම් ආදායම් වේ.
iii. ගැනිලි නිසා සිදුවන හිමිකමෙහි අඩුවීම් හැර හිමිකමේ සිදුවන අඩුවීම් වියදම් වේ
iv. මාස 12ක් වැනි කෙටි කාලයක් තුළ බේරුම් කළ යුතු බැඳීම් ජංගම වගකීම් වේ.

(25). අනාගත ආර්ථික ප්‍රතිලාභයක් වන්නේ,
i. භාණ්ඩ නිෂ්පාදනය කර විකිණීම සඳහා වූ යන්ත්‍රයක් විකිණීමෙන් මුදල් ගලා ඒම.
ii. භාණ්ඩ බෙදා හැරීම සඳහා යොදාගෙන තිබූ වෑන් රථය විකිණීමෙන් මුදල් ගලා ඒම.
iii. ව්‍යාපාරය පරිහරණය කරන ලද ලිබඩු විකිණීමෙන් මුදල් ගලා ඒම.
iv. විකිණීමට ඇති භාණ්ඩ තොගයක් අනාගතයේදී විකිණීමෙන් ලාභ ලැබීම.

(26). නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.
i. වත්කම් = හිමිකම් - වගකීම්
ii. වගකීම් = වත්කම් - හිමිකම්
iii. හිමිකම් = වගකීම් + වත්කම්
iv. වගකීම් = වත්කම් + හිමිකම්



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

(27). "වත්කම් = හිමිකම්" ලෙස ගිණුම්කරණ සමීකරණය දක්වා ඇත. ඉන් ප්‍රකාශ නොවනුයේ,
i. ව්‍යාපාරයට අයත් සම්පත් සියල්ල අයිතිකරුවා විසින්ම යොදා ඇති බවය.
ii. ව්‍යාපාරය සතුව ප්‍රමාණවත් සම්පත් ප්‍රමාණයක් නොමැති බවය.
iii. ගෙවා දමා පියවිය යුතු බැඳීම් නොපවතින බවය.
iv. බාහිර පාර්ශවයකින් ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් ලබාදී නොමැති බවය.

(28). ගිණුම්කරණ සමීකරණයේ වත්කම්වලට පමණක් බලපෑම් දෙකම සිදුනොවන ගනුදෙනුව වනුයේ,
i. ණයගැතියන්ගෙන් මුදල් ලැබීම.
ii. යන්ත්‍රයක් මිලට ගැනීම.
iii. බඩු තොගයක් ණයට ගැනීම.
iv. වෙළඳ භාණ්ඩ මිලට ගැනීම.

(29). වත්කම් හා වගකීම් යන අයිතම දෙකම වැඩිවීම සඳහා පමණක් බලපාන ගනුදෙනුව වනුයේ,
i. බැංකු ණයක් ලබා ගැනීම.
ii. බඩු තොග මිලට ගැනීම.
iii. ණයහිමියන් පියවීම.
iv. ණයගැතියන්ගේ මුදල් ලැබීම.

(30). වැඩිවීම බැර අඩුවීම හර යන න්‍යායට අදාළ නොවන ගිණුම වන්නේ,
i. විකුණුම් ගිණුම
ii. බැංකු ණය ගිණුම
iii. ණයහිමි ගිණුම
iv. බැංකු ණය පොලී ගිණුම

(31). හිමිකම වෙනස්වීම කෙරෙහි බලපාන ගණුදෙනුව තෝරන්න.
i. ණයහිමියන්ට රු. 12,000ක් ගෙවීම.
ii. රු. 10,000ක බඩු තොග රු. 8,000කට ණයට විකිණීම.
iii. රු. 40,000ක බැංකු අයිරාවක් අනුමත කර ගැනීම.
iv. අයිතිකරු රු. 3,000ක් තම පෞද්ගලික විදුලි බිල පෞද්ගලික මුදලින් ගෙවීම.

(32). ලෙජරය යනු,
i. ගිණුමකි.
ii. උපයෝගී පොතකි.
iii. මූලාශ්‍ර ලේඛනයකි.
iv. ගිණුම්වල එකතුවකි.

(33). "මූලික සටහන් පොත" යන පදයට සමාන අරුතක් ලබා නොදෙන පදය තෝරන්න.
i. පොදු ජ'නලය
ii. උපයෝගී පොත්
iii. ජ'නල්
iv. දෛනික පොත්

(34). බැංකු ගිණුම ආශ්‍රිත මූලාශ්‍ර ලේඛනයක් නොවන්නේ,
i. ගෙවීම් වවුචරය
ii. ලදුපත
iii. තැන්පත් කුවිතාන්සිය
iv. iv. බැංකු ප්‍රකාශය

(35). ණයගැතියෙකුගෙන් ලැබී බැංකුවේ තැන්පත් කළ රු. 2,000ක චෙක්පතක් අගරු වීම ගිණුම් ගත කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

i. මුදල් ගිණුම හර රු. 2,000
බැංකු ගිණුම බැර රු. 2,000

ii. බැංකු ගිණුම හර රු. 2,000
අගරු චෙක් ගිණුම බැර රු. 2,000

iii. ණයහිමි ගිණුම හර රු. 2,000
බැංකු ගිණුම බැර රු. 2,000

iv. ණයගැති ගිණුම හර රු. 2,000
බැංකු ගිණුම බැර රු. 2,000

(36). සිල්ලර වෙළෙන්දෙකු වූ සමන් විසින් සුගත්ට නිකුත් කරන ලද චෙක්පත අගරු විය. එලෙස අගරුවීමට හේතුවිය හැකි කරුණක් වන්නේ,
i. සුගත්ගේ බැංකු ජංගම ගිණුමේ මුදල් නොතිබීම.
ii. සමන්ගේ ජංගම ගිණුමේ ප්‍රමාණවත් මුදලක් පැවතීම.
iii. සුගත් විසින් මාස 6ක කාලයක් තුළ චෙක්පත බැංකුවට ඉදිරිපත් කර නොතිබීම.
iv. මුදලින් හා ඉලක්කමින් ලියා ඇති චෙක්පතේ වටිනාකම එකිනෙකට සමාන වීම.



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

(37). I තීරුවේ දක්වා ඇති උපයෝගී පොත් හා II තීරුවේ දක්වා ඇති මූලාශ්‍ර ලේඛනයන් පිළිවෙළින් ගැලපූ විට පිළිතුර වන්නේ,

| I | II |
|---|---|
| 1. ගැනුම් ජ'නලය | A. සුළු මුදල් ගෙවීම් වවුචරය |
| 2. පොදු ජ'නලය | B. ගැනුම් ඉන්වොයිසිය |
| 3. බැංකු ගිණුම | C. ජ'නල වවුචරය |
| 4. සුළු මුදල් පොත | D. ගෙවීම් වවුචරය |

i. ABCD ii. BCDA iii. CDAB iv. BACD

(38). 'මුදල් මැමය' යනු,
i. ඉන්වොයිසිය
ii. සුළු මුදල් වවුචරය
iii. වවුචරය
iv. ලදුපත.

(39). මුදල් පොතක ද්විත්ව කාර්යය යනු,
i. මූලික සටහන් පොතක හා ලෙජර් ගිණුමක කාර්යයයි.
ii. මූලාශ්‍ර ලේඛනයක හා මූලික පොතක කාර්යයයි.
iii. මූලාශ්‍ර ලේඛනයක හා ලෙජර් ගිණුමක කාර්යයයි.
iv. උපයෝගී පොතක හා මූලාශ්‍ර ලේඛනයක කාර්යයයි.

(40). බැංකුව අයිරාව,
i. වත්කමකි. ii. හිමිකමකි. iii. වගකීමකි. iv. වියදමකි

(ලකුණු 1*40=40)

***


SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

**කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර**
**வலயக் கல்வி காரியாலயம் கொழும்பு – ஸ்ரீ ஜயவர்தனபுரம்**
**Zonal Education Office Colombo - Sri Jayawardhanapura**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2025**
**Second Term Test - 2025**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

| 10 ශ්‍රේණිය | II පත්‍රය | කාලය : පැය 02යි |
|---|---|---|

* **පළමුවන ප්‍රශ්නය සහ I කොටසෙන් ප්‍රශ්න දෙකක්ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01). පහත සඳහන් සිද්ධි ඇසුරෙන් ප්‍රශ්න i සිට ix දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

මන්දෝදරී හර්බල් නිෂ්පාදන ආයතනය 100%ක් ස්වභාවික දේශීය හා විදේශීය අමුද්‍රව්‍ය භාවිතා කරමින් ආයුර්වේද බෙහෙත් වර්ග නිෂ්පාදනය කරයි. එහි හිමිකාරිය වන මන්දෝදරී ශාක්‍යසිංහ විසින් තම මුත්තණුවන් වන සේනා ශාක්‍යසිංහ වෙද මහතා විසින් ලබාදෙන ලද ඉපැරණි ආයුර්වේද රහසිගත බෙහෙත් වට්ටෝරු භාවිතා කිරීම, මෙම නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා ප්‍රතිඵලදායී බව ඉහළ නැංවීමට හේතුවක් වී ඇත.

පසුගියදා ආරම්භ වූ ඉන්දු පකිස්ථානය යුද ගැටුම් හේතුවෙන් මෙතෙක් කල් ඉන්දියාවෙන් අපනයනය කරන ලද ආයුර්වේද බෙහෙත් වර්ග ආනයනය කිරීම පකිස්ථානය විසින් තහනම් කරන ලද පසුබිමක, අපනයන වෙළඳපළට ප්‍රවිෂ්ට වීමේ අදහසක් ද මන්දෝදරී තුළ ඇත.

2024 ජනවාරි මස පළමු දින රු. 80,000ක් මුදලින්, රු. 100,000ක් වටිනා තම නිවස, රු. 40,000ක් වටිනා තම මෝටර් රථයක්, රු. 10,000ක් වටිනා තම පරිගණකයක් යොදවා ආරම්භ කරන ලද මෙම ව්‍යාපාරය කෙටි කාලයක් තුළ ඉතා දියුණු තත්වයකට පත්විය. 2024.12.31 දිනෙන් අවසන් වසර සඳහා එහි ආදායම රු. 350,000ක් හා වියදම රු. 240,000ක් ද වන අතර මන්දෝදරී තම පෞද්ගලික ගමන් බිමන් සඳහා මෝටර් රථය භාවිතා කිරීම වෙනුවෙන් දරා ඇති ඉන්ධන වියදම රු. 2,000කි. එම කාලච්ඡේදය තුළ කිසිදු අමතර ප්‍රාග්ධනය යෙදවීමක් සිදුවී නැත.

i. මෙම ව්‍යාපාරයෙන් සපුරනු ලබන අවශ්‍යතාවය හා වුවමනාව කුමක්ද?

ii. අ. හිමිකාරීත්වය අනුව හා අරමුණ අනුව ඉහත ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ග මොනවාදැයි වෙන වෙනම දක්වන්න.

ආ. නිෂ්පාදිතයේ ස්වභාවය අනුව මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේද?

iii. අ. ඉහත ව්‍යාපාරයේ දක්නට ලැබෙන ශක්තීන් දෙකක් ලියන්න.

ආ. මන්දෝදරී ව්‍යාපාරයට ලැබෙන අවස්ථාවක් ලියන්න.

iv. අ. මෙම ව්‍යාපාරයේ දක්නට ලැබෙන අභ්‍යන්තර හා බාහිර පරිසර සාධක දෙකක් ලියන්න.

ආ. ගෝලීය පරිසරයෙන් මෙම ව්‍යාපාරයට එල්ල වන හිතකර බලපෑම් දෙකක් ලියන්න.

v. මන්දෝදරී යෙදවූ රු. 80,000 සටහන් කරනු ලබන මූලික සටහන් පොත හා මූලාශ්‍ර ලේඛනය කුමක්ද?

vi. ඉහත ව්‍යාපාරයේ 2024.01.01 දිනට හිමිකම කොපමණද?

vii. 2024.12.31 දිනට හිමිකම කොපමණද?


SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

viii. මෙම ව්‍යාපාරයේ අයිතිකරු රු. 80,000ක මුදල් ප්‍රාග්ධනයක් යෙදවීම හා අයිතිකරු තම පෞද්ගලික ගමන් බිමන් සඳහා භාවිතා කළ ඉන්ධන වියදම ගිණුම් ගත කිරීමට අදාළ ද්විත්ව සටහන් ලියන්න.

ix. ඉහත viii හි සඳහන් ගනුදෙනු දෙක ගිණුම්කරණ සමීකරණයෙහි දක්වන්න.

x. මන්දෝදරී ව්‍යාපාරයේ ආරම්භක දිනයේදී එහි දක්නට ලැබුණු ජංගම වත්කමක් හා ජංගම නොවන වත්කමක් වටිනාකම් සහිතව ලියන්න.

(ලකුණු 2 *10= 20)

## I කොටස

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න.)

(02).

i. (අ.) අවශ්‍යතා යනු මොනවාද? (ලකුණු 01)

(ආ.) මිනිස් අවශ්‍යතාවයක් නම් කර, ඒ හා සම්බන්ධ වුවමනාවක් ලියන්න. (ලකුණු 01)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න. (ලකුණු 02)

(අ.) භාණ්ඩ නිෂ්පාදකයාගෙන් වෙන්කළ නොහැක.

(ආ.) පේරාදෙණිය උද්භිද උද්‍යානයෙන් හා සිංහරාජ වනයෙන් ලබා ගන්නා පලතුරු භූමි සාධකයට අයත් වේ.

(ඉ.) අවශ්‍යතා නිසගයෙන් බිහි වේ.

(ඊ.) ව්‍යාපාර විසින් සිදු කරන පරිසරය සුරැකීමේ ව්‍යාපෘති කෙරෙහි මහජනතාව අවධානය යොමු කරයි.

iii. නිෂ්පාදිතයේ ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කර දක්වන්න. (ලකුණු 02)

iv. (අ.) ඇල්මැති පාර්ශව දෙකක් නම්කර ඔවුන්ගේ අරමුණ බැගින් ලියන්න. (ලකුණු 01)

(ආ.) ඉහත (අ) හි සඳහන් කළ ඇල්මැති පාර්ශව දෙක ව්‍යාපාරයට ලබා දෙන දායකත්වයන් දෙකක් ලියන්න.

(ලකුණු 01)

(මුළු ලකුණු 08)

(03).

i. (අ.) ව්‍යාපාර පරිසරය යනු කුමක්ද? (ලකුණු 01)

(ආ.) ව්‍යාපාර පරිසරය වර්ග කර දක්වන්න. (ලකුණු 01)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යය ද අසත්‍ය ද යන්න දක්වන්න. (ලකුණු 02)

(අ.) නවලෝක කන්ස්ට්‍රක්ෂන්ස් සහ ආසිරි මෙඩිකල්ස් තරගකාරී ආයතන වේ.

(ආ.) පසුගිය මාසයේ ලූණු ආනයනය කිරීම ගෝලීය පරිසරයේ සිදුවන හිතකර බලපෑමකට උදාහරණයකි.

(ඉ.) ගනුදෙනුකරුවෝ හා තරගකරුවෝ බාහිර පරිසර සාධක වේ.

(ඊ.) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, නෛතික පරිසරයට අයත් වන ආයතනයකි.

iii. (අ.) මෝසම් වර්ෂා තත්ත්වයක් මගින් අවස්ථාවක් බිහිවන ව්‍යාපාරයක් හා තර්ජනයක් ඇති වන ව්‍යාපාරයක් නම් කරන්න. (ලකුණු 01)

(ආ.) ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමේදී අවධානය යොමු කරන අංග දෙකක් ලියන්න. (ලකුණු 01)

iv. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයේ සිදුවන හිතකර බලපෑම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 08)

SLGURU.LK



Education Purpose Only

SLGURU.LK

(04).

i. (අ.) හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන්න. (ලකුණු 01)

(ආ.) පෞද්ගලික අංශයේ ලාභ අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු 01)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න. (ලකුණු 02)

(අ.) වෙළෙඳපොළ කොටස අඩු ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නම් වේ.

(ආ.) දිවිසුර සපරමාදු විසින් පවත්වාගෙන යනු ලබන "දිවිසරු" පොත්හලේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්යය වේ.

(ඉ.) සංස්ථාපිත සමාගම් හා රාජ්‍ය සංස්ථාවල අධ්‍යක්ෂක මණ්ඩලයක් දක්නට ලැබේ.

(ඊ.) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය රාජ්‍ය සංස්ථාවකි.

iii. (අ.) සමුපකාර සමිතිවල වාසි දෙකක් ලියන්න. (ලකුණු 01)

(ආ.) හවුල් ව්‍යාපාරවල අවාසි දෙකක් ලියන්න. (ලකුණු 01)

iv. යෝග්‍ය ව්‍යාපාර සංවිධානයත් තෝරා ගැනීමේ දී සලකා බලනු ලබන සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 08)

## II කොටස

**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න.)**

(05).

i. ගිණුම්කරණය යනු කුමක්ද? (ලකුණු 02)

ii. වගකීම්වල දක්නට ලැබෙන ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 02)

iii. පහතින් දක්වා ඇති අයිතම වත්කම්, වියදම්, ආදායම්, හිමිකම් හා වගකීම් යටතේ වර්ග කර දක්වන්න.(ලකුණු 04)

(1.) ප්‍රාග්ධනය
(2.) මෝටර් රථ
(3.) ණයහිමියෝ
(4.) විකුණුම්
(5.) ගැනිලි
(6.) ගැනුම්
(7.) ආයෝජන
(8.) ණයගැතියෝ

iv. පහත සඳහන් ගිණුම්කරණ සමීකරණ සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1.) | 60,000 | = | ...................... | + | 10,000 |
| (2.) | ...................... | = | 50,000 | + | 60,000 |
| (3.) | 90,000 | = | ...................... | + | 70,000 |
| (4.) | 50,000 | = | 70,000 | + | ...................... |

(මුළු ලකුණු 12)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

(06.)

i. ලෙජරය යනු කුමක්ද? (ලකුණු 02)

ii. ගිණුමක නිවැරදි ආකෘතිය ඇඳ දක්වන්න. (ලකුණු 02)

iii. පහත සඳහන් ගිණුම්කරණ සමීකරණය ආශ්‍රයෙන් එක් එක් දිනයේ සිදුවී ඇති ගනුදෙනුව සඳහා ගැලපෙන උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 04)

| දිනය | වත්කම් | = | ප්‍රාග්ධනය | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 2024.05.01 | + 10,000 | = | + 10,000 | + | - |
| 2024.05.03 | + 25,000 | = | - | + | + 25,000 |
| 2024.05.04 | - 1,000 | = | - 1,000 | + | - |
| 2024.05.09 | - 15,000 | = | - | + | - 15,000 |

iv. පහත දැක්වෙන ගනුදෙනු වල ද්විත්ව බලපෑම ලියන්න. (ලකුණු 04)

(1.) සේවක වැටුප් ගෙවීම.

(2.) බැංකු ණය ගැනීම.

(3.) බඩු තොග ණයට ගැනීම.

(4.) බඩු තොග ණයට විකිණීම.

(මුළු ලකුණු 12)

(07).

i. මූලික සටහන් පොත් යනු මොනවාද? (ලකුණු 02)

ii. පහත සඳහන් ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන ලියන්න. (ලකුණු 02)

(1.) මුදල් ලැබීම.

(2.) බැංකුවේ මුදල් තැන්පත් කිරීම.

(3.) චෙක්පත් නිකුත් කිරීම.

(4.) සුළු මුදල් ගෙවීම.

iii. පහත ගනුදෙනුවල ද්විත්ව සටහන ලියන්න. (ලකුණු 04)

(1.) රු. 300,000ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීම.

(2.) විකිණීම සඳහා රු. 75,000ක බඩු තොග ණයට ගැනීම.

(3.) රු. 150,000ක බැංකු ණයක් ලබා ගැනීම.

(4.) රු. 50,000ක් බැංකු ණයෙන් කොටසක් ලෙස ගෙවීම.

iv. පහත සඳහන් ගනුදෙනු බැංකු ගිණුමට පිටපත් කර තුලනය කර දක්වන්න. (ලකුණු 04)

| | |
|---|---|
| 2024.03.01 | රු. 75,000ක මුදල් පොතේ ආරම්භක ශේෂය |
| 2024.03.03 | රු. 25,000ක් තැන්පත් කොට බැංකු ජංගම ගිණුමක් විවෘත කිරීම. |
| 2024.03.06 | අංක 43 දරණ රු. 15,000ක චෙක්පත නිකුත් කර භාණ්ඩ මිලදී ගැනීම. |



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

| | |
|---|---|
| 2024.03.08 | පහත සඳහන් චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීම. |
| | ණයගැතියන්ගෙන් ලැබී තිබූ අංක 45 දරණ රු. 10,000ක චෙක්පත |
| | අත්පිට විකුණුම් වලින් ලැබී ඇති අංක 35 දරණ රු. 15,000ක චෙක්පත |
| 2024.03.10 | මුදලින් රු. 15,000ක් බැංකුවේ තැන්පත් කිරීම. |
| 2024.03.12 | අංක 47 දරණ චෙක්පතෙන් කඩකුලී ගෙව්වා රු. 15,000යි. |
| 2024.03.20 | චෙක්පත් නිකුත් කිරීම. |
| | දුරකථන ගාස්තු සඳහා අංක 48 දරණ රු. 5,000ක චෙක්පත |
| | ණයහිමියන් සඳහා අංක 49 දරණ රු. 6,000ක චෙක්පත |
| 2024.03.25 | දුරකථන ගාස්තු අංක 48 දරණ චෙක්පත අගරු විය. |
| 2024.03.26 | දුරකථන ගාස්තු අගරු චෙක්පත සඳහා අංක 50 දරණ රු. 5,000ක නව චෙක්පතක් නිකුත් කරන ලදී. |
| 2024.03.28 | අත්පිට විකුණුම් සඳහා ලැබුණු අංක 100 දරණ රු. 25,000ක චෙක්පත එම අවස්ථාවේදී ම බැංකුවේ තැන්පත් කරන ලදී. |

(මුළු ලකුණු 12)

***



SLGURU.LK
Education Purpose Only